සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved



බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
Year End Evaluation

| ශ්‍රේණිය / தரம் / Grade | 06 | විෂයය / பாடம் / Subject | නර්තනය | පත්‍රය / வினாத்தாள் / Paper | I,II | කාලය / காலம் / Time | පැය 2 |
|---|---|---|---|---|---|---|---|

නම :- ........................................................................................ විභාග අංකය :- ..............................

සැලකිය යුතුයි:
- I කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- අංක 16-20 දක්වා ප්‍රශ්න තෝරාගත යුත්තේ ඔබ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායට අනුව ය.

## I පත්‍රය

- නොගැලපෙන වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

(01) තෛපොංගල්, වෙසක්, නත්තල්, අවුරුදු

(02) කඳු නැගීම, විදුලි කෙටීම, පල්ලම් බැසීම, තලා ශබ්දය

(03) අවකාශ භාවිතය, සදිශා, තල, රටා

(04) චෙම්බු, කළ, කෝලාට්ටම්, කාවඩි

(05) දළදා පෙරහැර, පත්තිනි පෙරහැර, දුරුතු පෙරහැර, බිසෝ පෙරහැර

- පහත දැක්වෙන වාක්‍ය සත්‍ය නම් (ස) අකුර ද අසත්‍ය නම් (අ) අකුර ද යොදන්න.

(06) නර්තනයට උචිත පරිදි පාද හුරු කර ගැනීම සඳහා පා සරඹ නර්තනය කරයි. ( )

(07) ∧ මෙය තෙයි සඳහා යොදන සලකුණයි. ( )

(08) නානුමුර මංගල්‍යය සබරගමු සමන් දේවාල පෙරහැරේදී දක්නට නොලැබෙන චාරිත්‍රයකි. ( )

(09) ආගමික උත්සව වලදී ගොප් සැරසිලි දැකිය හැකිය. ( )

(10) සකපෝරුවෙන් කළගෙඩිය සාදා ගනු ලබයි. ( )

- නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(11) මානසික හා කායික ශක්තීන් වර්ධනයවීම........................... අභ්‍යාසයෙන් ලැබෙන ප්‍රයෝජනයකි.
(1) නම්‍යතා (2) සරඹ (3) නර්තන (4) නිවැරදි ඉරියව්

(12) 'දියගොඩ සැමතැන කිරි ඉතිරේ'... ගීතයෙන්.................................... අසිරිය ගැන කියවේ.
(1) මලක (2) නැළවිලි ගීයක (3) ළමා ගීයක (4) පරිසරයේ

195

(13) .............................. නැටුම විනෝදය මුල් කර ගනිමින් සුවිශේෂී ජවයක් සහිතව නර්තනයේ යෙදේ.
(1) කුළු (2) කළගෙඩි (3) ලී කෙළි (4) ගොයම්

(14) පන්ති කාමරයේ දී සිය ජීවිතය වර්ධනය කර ගැනීමට දායක වන සජීවී ක්‍රියාවලියකි.
(1) නමස්කාරය කිරීම (2) සරඹ නැටීම
(3) නම්‍යතා අභ්‍යාස කිරීම (4) චලන අභ්‍යාස කිරීම

(15) නර්තනයේ දී සිරුර හසුරුවන ආකාරයක් මෙම රූපයෙන් දක්වා ඇත.
(15) එහි A අක්ෂරයෙන් දක්වෙන්නේ.....................වලට අයත් කොටසකි.
(1) අංග (2) ප්‍රත්‍යාංග
(3) උපාංග (4) ඉරියව්




- 16 සිට 20 දක්වා ප්‍රශ්න අංක තෝරා ගැනීමේ දී ඔබ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායට අනුව පිළිතුරු සපයන්න.

## II කොටස - උඩරට

(16) පා සරඹ අවසන් කරනුයේ,
(1) හමාර පදයකින් ය. (2) කස්තිරමකින් ය. (3) අඩව්වකින් ය. (4) බෙර පදයකින් ය.

(17) බෙර වාදනයට හා ලයට අනුව නර්තනය කරන සරඹ වන්නේ,
(1) පා සරඹයි. (2) ගොඩ සරඹයි (3) ඉලංගම් සරඹයි (4) දොඹින පදයි

(18) 'තනම් දනත් තම්' යන තානමේ නාදමාලාවෙන් ගැයෙන්නේ,
(1) තුරගා වන්නමයි (2) වෛරෝඩි වන්නමයි.
(3) හනුමා වන්නමයි (4) සැවුලා වන්නමයි.

(19) සමන් දේවාල පෙරහැරෙහි දක්නට ලැබෙන උඩරට නර්තන අංගයක් වන්නේ,
(1) කාවඩි නැටුමයි. (2) මාත්‍රා පහේ නැටුමයි.
(3) තෙල්මම නැටුමයි. (4) වෙස් නැටුමයි.

(20) උඩරට නර්තන සම්ප්‍රදාය ප්‍රවර්ධනයට දායක වූ නර්තන ශිල්පියෙකි.
(1) නිත්තවෙල ගුණයා මහතා (2) එන්.ඒ.සිරිබෝහාමි මහතා
(3) එස්.එච්.සවිරිස් සිල්වා මහතා (4) කේ.එස්.ප්‍රනාන්දු මහතා

## III කොටස - පහතරට

(16) පා සරඹ අවසන් කරනුයේ,
(1) හමාර පදයකින් ය. (2) කස්තිරමකින් ය. (3) අඩව්වකින් ය. (4) බෙර පදයකින් ය.

(17) බෙර වාදනයට හා ලයට අනුව නර්තනය කරන සරඹ වන්නේ,
(1) පා සරඹයි (2) ඉලංගම් සරඹයි (3) ගොඩ සරඹයි (4) දොඹින පදයි

(18) 'තෙනෙනම් තෙන තෙනෙ නා...' යන තානමේ නාද මාලාවෙන් ගැයෙන්නේ.
(1) ශුද්ධ තාලය සින්දු වන්නමයි. (2) ලලිත රාග තාලය සින්දු වන්නමයි.
(3) හනුමන්තා තාලය සින්දු වන්නමයි. (4) අනුරාගදණ්ඩ තාලය සින්දු වන්නමයි.

(19) සමන් දේවාල පෙරහැරෙහි දක්නට ලැබෙන පහතරට නර්තන අංගයක් වන්නේ,
(1) කාවඩි නැටුමයි. (2) මාත්‍රා පහේ නැටුමයි.
(3) වෙස් නැටුමයි. (4) තෙල්මේ නැටුමයි.

(20) පහතරට නර්තන සම්ප්‍රදාය ප්‍රවර්ධනයට දායක වූ නර්තන ශිල්පියෙකි.
(1) එස්.එච්.සව්රිස් සිල්වා මහතා (2) එන්.ඒ.සිරිබෝහාමි මහතා
(3) තිත්තවෙල ගුණයා මහතා (4) පණීභාරත මහතා

## IV සබරගමු

(16) මණ්ඩි පදය හමාර කරනුයේ,
(1) හමාර පදයකින් ය. (2) කස්තිරමකින් ය. (3) අඩව්වකින් ය. (4) බෙර පදයකින් ය.

(17) බෙර වාදනයට හා ලයට අනුව නර්තනය කරන සරඹ වන්නේ,
(1) පා සරඹයි. (2) දොඹින පදයයි. (3) ඉලංගම් සරඹයි. (4) ගොඩ සරඹයි.

(18) 'තතෙනා තත තාන තතම්දත' යන තාතමේ නාදමාලාවෙන් ගැයෙන්නේ,
(1) මණ්ඩුක වන්නමයි (2) කොවුලා වන්නමයි. (3) අනිලා වන්නමයි (4) සැවුලා වන්නමයි

(19) සමන් දේවාල පෙරහැරෙහි දක්නට ලැබෙන සබරගමු නර්තන අංගයක් වන්නේ,
(1) කාවඩි වන්නමයි. (2) වෙස් නැටුමයි. (3) තෙල්මේ නැටුමයි. (4) මාත්‍රා පහේ නැටුමයි.

(20) සබරගමු නර්තන සම්ප්‍රදාය ප්‍රවර්ධනයට දායක වූ නර්තන ශිල්පියෙකි.
(1) එන්.ඒ.සිරිබෝහාමි මහතා (2) තිත්තවෙල ගුණයා මහතා
(3) එස්.එච්.සව්රිස් සිල්වා මහතා (4) කේ.එස්.ප්‍රනාන්දු මහතා

## II පත්‍රය

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 03ක ට පිළිතුරු සපයන්න.

(01) විවිධ අත්දැකීම් ඇසුරෙන් නිර්මාණය කරන ලද කලාංග මතකයට නංවා ගනිමින් පිළිතුරු සපයන්න.

(i) ගොප් සැරසිලි සඳහා යොදා ගත හැකි අමු ද්‍රව්‍ය 02ක් නම් කරන්න. (ලකුණු 02)

(ii) ගොප් කැටයම කැපීමට පෙර කල යුතු මූලික ක්‍රියාකාරකමක් සඳහන් කරන්න. (ලකුණු 02)

(iii) ගොප් සැරසිලි දැක ගත හැකි අවස්ථා දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(iv) පන්ති කාමරයේ දී මෙවන් නිර්මාණයක් කිරීමේ දී ඔබ ලබා ගත් අත්දැකීම් 2ක් ලියන්න. (ලකුණු 02)

(v) ඔබ පාසලේ උත්සවයක් අලංකාර කර ගැනීමට සුදුසු ගොප් සැරසිල්ලක් අඳින්න. (ලකුණු 02)

(02)

| |
|---|
| ගැට බෙරය, ටින් බෙරය, එක්සරේ රබාන, පහතරට බෙරය, තාලම්පට, ටොනික් වළල්ල, ගොප්කොළ නලාව, අත් රබාන |

(i) ඉහත සටහනෙන් දක්වා ඇති භාණ්ඩ හා උපකරණ පන්ති කාමරයේ දී වර්ග දෙකකට වෙන් කරන ලදී. එම වර්ග දෙක නම් කරන්න. (ලකුණු 02)

(ii) එම වර්ග දෙකට අනුව ඉහත භාණ්ඩ හා උපකරණ වෙන් කර ලියන්න. (ලකුණු 04)

(iii) එම භාණ්ඩ භාවිතයට ගත හැකි අවස්ථා 2ක් නම් කරන්න. (ලකුණු 04)

(03) ගැමි නැටුම් හා සබැඳි සුවිශේෂ ලක්ෂණ හඳුනා ගනිමින් 'ගැමි නැටුම් නිර්මාණයට එක් වෙමු'

ගැමි නැටුම් හා සබැඳි සුවිශේෂ ලක්ෂණ ඇඳ නම් කරන්න.

(i) පංති කාමරයේ දී ඉගෙන ගත් ගැමි නැටුමකට අදාල රංග උපකරණය ඇඳ නම් කරන්න. (ලකුණු 02)

(ii) එම ගැමි නැටුම නම් කර ඊට අදාල කවියක් ලියන්න. (ලකුණු 04)

(iii) තිමාවක් සහිත ගැමි නැටුමක් ප්‍රාසාංගිකව ඉදිරිපත් කිරීමට සැලකිලිමත් වූ කරුණු 02ක් ලියන්න. (ලකුණු 04)

(04) ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායන් හඳුනා ගනිමු.




(i) A,B,C, යන අක්ෂරයන්ට අයත් ප්‍රදේශයන්හි ප්‍රචලිත නර්තන සම්ප්‍රදායයන් ත්‍රිත්වය ලියන්න. (ලකුණු 03)

(ii) එම සම්ප්‍රදායයන් ත්‍රිත්වයට අදාළ ප්‍රධාන වාද්‍ය භාණ්ඩ නම් කරන්න. (ලකුණු 03)

(iii) 'නර්තන සම්ප්‍රදායයන් රැක ගැනීමේ වැදගත්කම' යන මැයෙන් වගන්ති 02ක් ලියන්න. (ලකුණු 04)